# 2025 ජුලි මාසයට අදාලව 2025.07.22 වන දින පවත්වන ලද
# බිබිල ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ වාර්තාව.

**දිනය** - 2025.07.22
**වේලාව** - පෙ.ව. 9.30
**ස්ථානය** - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.

**සහභාගීත්වය** -

01. වී.සරත් විදානගම මැතිතුමා - ගරු සභාපති
02. එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා - ගරු උප සභාපති
03. ආර්.බී. අත්තනායක මැතිතුමා - ගරු මන්ත්‍රී
04. ඩබ්.එම්. රූපසේන මැතිතුමා - ගරු මන්ත්‍රී
05. බී.එම්. වීරසේකර මැතිතුමා - ගරු මන්ත්‍රී
06. ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා - ගරු මන්ත්‍රී
07. ඩී.එම්. ශ්‍රියානි මංගලිකා ජයලත් මැතිතුමිය - ගරු මන්ත්‍රී
08. ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා - ගරු මන්ත්‍රී
09. පී.ජයන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රී
10. ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා - ගරු මන්ත්‍රී
11. ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා - ගරු මන්ත්‍රී
12. පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා - ගරු මන්ත්‍රී
13. එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා - ගරු මන්ත්‍රී
14. කේ.ජී. උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා - ගරු මන්ත්‍රී
15. එල්.ඒ.බී. චින්තිකා හර්ෂනි මැතිතුමිය - ගරු මන්ත්‍රී
16. ජේ.ඒ.ජී. විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා - ගරු මන්ත්‍රී

## 01.පසුගිය මාසයේ සභා රැස්වීමේ වාර්තාව සහා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් මූලාසනය හොබවන ලද අතර 2025.06.24 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා වෙත 2025.07.14 වන දින යොමුකර ඇති බැවින් එම වාර්තාව මෙම සභාවේ කියවූවා සේ සලකා වාර්තාව සහා සම්මත කර ගන්නා ලෙසත් වාර්තාවේ සංශෝධන කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් මූලාසනය විසින් සභාවට දන්වන ලදි.

එහිදී ගරු මන්ත්‍රී ඒ.එම්. ජානක නිමල් බණ්ඩාර මැතිතුමා පසුගිය මස සභා වාර්තාව සහා සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්. රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එම අවස්ථාවේ ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් සභා වාරයේ උපදේශක කාරක සභා පත් කිරීමේදී ගරු තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් පවසා සිටි 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ රීතිවල සඳහන් 31(6) වගන්ති ප්‍රකාරව මාධ්‍යවේදියකු කාරක සභා සඳහා පත් කිරීමට නොහැකි බවට සාවද්‍ය ප්‍රකාශයක් සිදුකල බවත් එහි සඳහන් වනුයේ "පුවත්පත් වාර්තාකරුවන් උපදේශක කාරක සභා රැස්වීම්වලට ඇතුල් නොකළ යුතුය." ලෙස බැවින් කාරක සභා සඳහා මාධ්‍යවේදීන් පත්කළ හැකි බවත් එම කාරක සභාව රැස්වන අවස්ථාවේ වාර්තාකරණයේ යෙදීමට නොහැකි බව පෙන්වා දෙන ලදී.

එහිදී ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා ප්‍රකාශකර සිටියේ කාරක සභාව රැස්වන අවස්ථාවේ මාධ්‍යවේදියෙකු වාර්තාකරණය සඳහා අවශ්‍ය උපකරණ භාවිතා නොකළද වාර්තා කිරීමේ හැකියාව ඔහු සතු බවයි.

සභා රීති වලට අනුව සභා රැස්වීම් පවත්වන බැවින් සභාව නොමග යවන ආකාරයේ ප්‍රකාශ ඉදිරිපත් කිරීමෙන් වලකින ලෙස ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් පවසා සිටි අතර මාධ්‍යවේදියෙකු කාරක සභා රැස්වීමක තොරතුරු වාර්තා කරනු ලැබුවහොත් නීතිමය පියවර ගැනීමට හැකියාවක් පවතින බැවින් මාධ්‍යවේදියකු කාරක සභා සඳහා පත්කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් පවසා සිටින ලදී.

වෙනත් අදහස් දැක්වීමක් නොවූයෙන් 2025.06.24 දිනැති සභා වාර්තාව සභා සම්මත විය

## 02. මූලාසනය විසින් කරනු ලැබූ විශේෂ නිවේදන.

## 02.01.ඌව පළාතේ අඩු ආදායම්ලාභීන් සඳහා 60% - 40% සහන පදනම මත විදුලිය ලබාදීම.

ඌව පළාතේ අඩු ආදායම්ලාභී ජනතාවගේ සාමාජීය, ආර්ථික, හා අධ්‍යාපනික තත්වය උසස් මට්ටමකට පත් කිරීමේ අරමුණින් මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බල ශක්ති , ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශය 60% - 40% සහන පදනම මත විදුලිය ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන බැවින් අඩු ආදායම්ලාභීන්ගේ නිවාස වලට නව විදුලි සම්බන්දතා ලබා ගැනීමේදී ඒ සඳහා වැය වන මුදලින් 40% ක මුදලක් ප්‍රතිලාභියා විසින් දැරිය යුතු අතර 60% ක මුදල මෙම වැඩසටහන යටතේ ප්‍රතිලාභියා වෙත ලබාදීම සිදු කරයි. ඒ සඳහා

- පාරිභෝගික ඇස්තමේන්තුව මත විදුලිය ලබා ගැනීමට 60% මූල්‍ය ධායකත්වය පළාත් සභාවෙන් ලබා ගැනීම සඳහා අයදුම්පත
- විදුලි සම්බන්දතාව ලබා ගන්නා අයගේ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්
- විදුලිබල මණ්ඩලය මගින් ලබාගත් සේවා ඇමුණුම

යන ලිපිලේඛන හා විදුලිබල මණ්ඩලයෙන් ලබාගත් සේවා ඇමුණුමෙහි සඳහන් මුදලින් 40% මුදල සමඟ සතියේ දිනවල සවස 3.00ට පෙර මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බල ශක්ති , ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශය වෙත ගොස් ඔවුන්ට ලබා ගතහැකි ප්‍රතිලාභය ලබා ගන්නා ලෙසට තම කොට්ඨාශවල ජීවත්වන ජනතාව දැනුවත් කරන ලෙස ගරු සභාව දන්වන ලදී.

## 03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

## 04.යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න.

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

## 05.යථාපරිදි කල්දී ඇති යෝජනා.

## 05.01.ගරු මූලාසනයේ යෝජනා.

## 05.01.01. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බිබිල මහජන පුස්තකාලයේ සාමාජිකත්වය නොමිලේ ලබාදීම.

සැම වසරකම සැප්තැම්බර් මාසය සාහිත්‍ය මාසය ලෙස නම් කර ඇත. මෙම 2025 වර්ෂයේ සාහිත්‍ය මාසය හා ජාතික කියවීමේ මාසයට සමගාමීව බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පාඨකයින් 100 දෙනෙකුට නොමිලේ සාමාජිකත්වය ලබා දීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්. රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් මෙම නොමිලේ සාමාජිකත්වය ලබා දෙනු ලබන පාඨක පදනම පිළිබඳ ගරු සභාවෙන් විමසා සිටින ලදී.

පුද්ගලික ධන පරිත්‍යාගයෙන් පෞද්ගලික ඉඩමක් තුළ කණුල්වෙල පුස්තකාලයක් ඉදිකර ඇති බවත් එම පුස්තකාලය සඳහා පුද්ගලිකව පොත්පත් ලබාදී ඇති බවත් ස්වෙච්ඡාවෙන් එහි වැඩ කටයුතු සිදු කිරීමට කණ්ඩායමක් එක් වී කටයුතු කරන බව ගරු සභාපතිතුමා පැහැදිලි කළ අතර එම පුස්තකාලය නීතිමය තත්වයට අනුගත කිරීම සඳහා ද එම ප්‍රදේශවාසීන් විසින් ඉල්ලුම් කර ඇති බවත් එම පුස්තකාලයටද මෙම කියවීමේ මාසය වෙනුවෙන් පාඨකයින් සඳහා නොමිලේ සාමාජිකත්වය ලබාදීම සුදුසු බවත් ළමුන් 75 ක් හා වැඩිහිටියන් 25 ක් වශයෙන් පාඨකයින් 100ක් සඳහා නොමිලේ සාමාජිකත්වය ලබා දිම සුදුසු බව පවසා සිටින ලදී.

ඉකිරියන්පොල ලන්ද මව් හවුල විසින් ඉදිකර ඇති ඉකිරියන්පොල ලන්ද ජංගම පුස්තකාලය සඳහා දිනපතා ලංකාදීප හා තිනකරන් පුවත්පත් දෙක ලබාදෙන ලෙසට ඉල්ලීම් කර ඇති බැවින් එම පුවත්පත් දෙක ලබාදීමට සුදුසු බවට තමා අදහස් කරන බව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ජානක නිමල් බණ්ඩාර මැතිතුමා පවසා සිටියේ සිංහල ඉංග්‍රීසි දෙමළ භාෂා තුනෙන්ම අදාළ පොත්පත් කණුල්වෙල හා ඉකිරියන්පොල ලන්ද පුස්තකාලය සඳහා ලබා දීමට සුදුසු බවයි.

පුද්ගලික ධන පරිත්‍යාගයෙන් ඉදිකල කණුල්වෙල පුස්තකාලය, ඉකිරියන්පොලලන්ද මව් හවුල මගින් ඉදිකර ඇති ජංගම පුස්තකාලය, නාගල මහජන පුස්තකාලය ,කොටගම පුස්තකාලය, බිබිල මහජන පුස්තකාලය යන පුස්තකාල සඳහා 2025 වර්ෂයේ සැප්තැම්බර් මස සාහිත්‍ය මාසයට හා ජාතික කියවීමේ මාසයට සමගාමීව පාසල් පාඨකයින් 75ක් හා වැඩිහිටි පාඨකයින් 75ක් නියෝජනය වන ආකාරයට සාමාජිකයින් 100 දෙනෙකුට නොමිලේ සාමාජිකත්වය ලබා දීමට තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.02.බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ගලහවත්ත සිට මුංවත්ත දක්වා අතුරු මාර්ගය කොන්ක්‍රීට් කර ප්‍රතිසංස්කරණය කිරීම.

ගලහවත්ත සිට මුංවත්ත දක්වා අතුරු මාර්ගය ගමන් කිරීමට නොහැකි ආකාරයටම අබලන් වී ඇති බැවින් මාර්ග අනතුරු සිදුවීම මෙන්ම වාහන වලට මහජනතාවට ගමන් කිරීමටද අපහසු වී ඇති බැවින් එම මාර්ගය කොන්ක්‍රීට් කර ප්‍රතිසංස්කරණය කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාල යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එම අවස්ථාවේදී ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා විසින් මෙම මාර්ගය කුමන ස්ථානයක කුමන කොට්ඨාසයකට අයත් මාර්ගයක් දැයි න්‍යාය පත්‍රයට ඇතුළත් වී නොමැති බව පවසා සිටියේය.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී එම යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ජේ.එම්.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.03. බිබිල ප්‍රාදේශීය සභාවේ කාර්යාලයට පුටු මිලදී ගැනීම.

බිබිල ප්‍රාදේශිය සභාවේ නිලධාරින්හට කාර්යාල පුටු මිල දි ගැනීම සඳහා ප්‍රසම්පාදන සිදු කර මිල කමිටු තීරණ ලබා ගෙන ඇති අතර පියෙස්ට්‍රා ECL 001 වර්ගයේ පුටුවක් රු.18,953.00කට හා වගකීම් කාලය අවුරුදු 02 ක් සහිතව වැලිමඩ , හේමපාල මුණිපාල මාවත,අංක 56 ,ලෙවිස් ඇන්ඩ් සන්ස් ආයතනයෙන් මිලදි ගැනීමට තීරණ ය වි ඇත. නමුත් කාර්යාල පුටු මිලදි ගැනීම මේ වන තෙක් සිදු කර නොමැති අතර නිලධාරින් 28 දෙනෙකු සඳහා පුටු අවශ්‍ය බව සඳහන් කර ඇත. ඒ සඳහා නිලධාරීන්ගේ ඉල්ලීම කාර්මික නිලධාරි නිර්දේශ කර ඇති අතර සභා ලේකම් අනුමත කර ඇති අතර 2025.06.28 දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙන් නිර්දේශ කර ඇත.

ඒ අනුව පුටු අවශ්‍ය ප්‍රමාණය පහත පරිදි වේ.

- සංවර්ධන අංශය සඳහා දුඹුරු වර්ණ පුටු 06ක්ද,
- ගිණුම් අංශය සඳහා කළු වර්ණ පුටු 05ක්ද,
- ආදායම් අංශය සඳහා රතු වර්ණ පුටු 10ක්ද
- ආයතන අංශය සඳහා නිල් වර්ණ පුටු 07ක්ද,

සියලු නිලධාරින් සඳහා පුටු මිල දි ගැනීම අරමුණු කර ගනිමින් විවිධ වර්ණයන්ගෙන් පුටු මිලදි ගැනීමට යෝජනා වි තිබුණද , දැනට මිලදි ගනු ලබන්නේ පුටු අවශ්‍යතාවය සහිත නිලධාරින් සඳහා පමණක් වන බැවින් මිලදි ගන්නා වර්ණයෙන්ම පුටු ඇණවුම් කිරිම හා ඒ සඳහා කටයුතු කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී බිබිල ප්‍රදේශයේ සැපයුම්කරුවන් ලියාපදිංචි කරගෙන ඒ අය සඳහා ටෙන්ඩර් ලබා දීමට සුදුසු බව සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් කාර්යාලයට නව පුටු ලබා ගන්නා විට භාවිතයෙන් ඉවත් කරන පුටු වෙන්දේසි කර සභාව සඳහා ආදායම් උත්පාදනය කර ගැනීමට සුදුසු බවද පවසා සිටියේය.

ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා පවසා සිටියේ එම පුටු බහුකාර්ය ගොඩනැගිල්ලෙහි පුටු බැවින් ඒවා වෙන්දේසි කළ නොහැකි බවයි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>05.01.04. වාහන සඳහා GPS උපකරණ සවි කිරිම.</u>**

බිබිල ප්‍රාදේශිය සභාව සතු වාහන 11ක් සඳහා GPS උපරණ හා FUEL SENSOR සැපයීම, ස්ථාපනය කිරිම, ආරම්භ කිරිම හා නඩත්තු කිරිම සඳහා මිල ගණන් කැඳවා, තාක්ෂණික ඇගයීම් වාර්තා ලබා ගෙන ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කර ඇහැළියගොඩ ,අංක 204/A/3,02 TELEMATICS SOLUTION (PVD) LTD ආයතනයෙන් මිලදි ගැනීමට මිල කමිටු තීරණ ලබා ගෙන ඇත

ඒ සඳහා රු.694,100.00ක මුදලක්ද මාසිකව රු.12,100.00 මුදලක්ද වැය වන අතර එම GPS උපකරණ හා FUEL LEVEL SENSOR සැපයීම වෙනුවෙන් එම ආයතනය විසින් සේවා ගිවිසුමක්ද ඉදිරිපත් කර ඇත.

ඒ අනුව බිබිල ප්‍රාදේශිය සභාව සතු වාහන 11ක් සඳහා GPS උපකරණ හා FUEL LEVEL SENSOR උපකරණ ඇණවුම් කිරීමට, ගෙවීම් කිරීමට හා ඉදිරිපත් කර ඇති සේවා ගිවිසුම හා එකඟත්වය ලබා ගැනීමට සහා අනුමැතිය සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

මෙම යෝජනාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව වාහන පිළිබඳ දැනුම ඇති ව්‍යාපාරිකයින් කිහිප දෙනෙකු සමඟ සාකච්ඡා කිරීම තුළින් ඉන්ධන අව භාවිතය අවම කර ගැනීම සඳහා එම GPS උපකරණ සවි කිරීමට වඩා වෙනත් ක්‍රමයක් අනුගමනය කිරීම තුළින් සභාවේ අරමුදල් වැයවීම අවම කරගත හැකි බව පෙන්වා දෙන ලදී. එබැවින් එම යෝජනාව ඉදිරි සභාවකට කල් තැබීමට සුදුසු බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.

ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්පකුමාර මැතිතුමා විසින්ද ඉන්ධන දහනය වීම පිළිබඳ අදහස් දක්වන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාව සතු වාහන වල ඉන්ධන කළමණාකරනය කිරීමේ ක්‍රමයක් ලෙස ඉන්ධන පුරවනු ලබන විවරය සඳහා ඉබ්බෙකු සවි සවිකොට එහි යතුර සභවේ වගකිව යුතු නිලධාරියකු භාර තබා ගැනීමටත් වාහන සඳහා ඉන්ධන පිරවීමට යැමේදී ඉන්ධන පිරවුම්හල වෙත කාර්යාලයේ නිළධාරියකු එම ස්ථානයට ගොස් සිටියදී ඉන්ධන පුරවනු ලබන විට ඉබ්බා ඇර ඉන්ධන පුරවා අවසන්ව එම ඉබ්බා එම නිළධාරියා සිටියදීම අගුළු දැමීම සිදුකර එම අවස්ථාවේදීම රියදුරු සහ අධීක්ෂක නිළධාරියා විසින් නිවැරදි බව තහවුරු කලයුතු බවයි. වාහන සඳහා ඉන්ධන තැන් තැන් වලට රැගෙන ගොස් පිරවීමේදීද අධීක්ෂක නිළධාරියකු ගොස් එම වාහන සඳහා ද පෙර ලෙසම ඉන්ධන පිරවීම සුදුසු බවත් හා එම ඉන්ධන පිරවීමේ කටයුතු සඳහා නව සේවකයකු බඳවා ගැනීමටද සුදුසු බවත්ය. එවිට GPS උපකරණ සවි කිරීමට වඩා අඩු වියදමකින් ඉන්ධන කළමණාකරනය කිරීමට හැකි බව ගරු සභාපතිතුමා විසින් විස්තර කරන ලදී. එබැවින් මෙම යෝජනාව ඉදිරි සභා වාරය සඳහා කල් දැමීමට සුදුසු බව විස්තර කරන ලදී.

ඉන්ධන අවභාවිතා කළහොත් ඒ අය සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීමට පසුබට නොවන බව ගරු උප සභාපතිතුමා එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් පවසන ලදී.

ගරු මන්ත්‍රී ඒ.එම්. ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් 2026.06.27 දින පැවැත්වූ මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේදී මෙම යෝජනාව සාකච්ඡා කළ අතර කාලෝචිතව මෙම යෝජනාව ඉදිරි සභා වාරයට කල් තැබීමට සුදුසු බව යෝජනා කරන ලදී.

මෙම කල් තැබීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව ඉදිරි සභාවට කල් තැබීමේ මේ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.05. බිබිල සතොස ගොඩනැගිල්ලෙහි උඩුමහල ඉදිකිරීම.</u>

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් වාණිජ ගොඩනැගිල්ලක් වන සතොස ආයතනය පවත්වාගෙන යන ගොඩනැඟිල්ලෙහි උඩුමහල ඉදි කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී එම යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම අවස්ථාවේ ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා පවසා සිටියේ මීට පෙර පැවති පළාත් පාලන ආයතනයේ පාලකයින් විසින් ද මෙම සතොස ගොඩනැගිල්ලේ උඩුමහල ඉදිකිරීමට යෝජනා කර තිබූ බවත් එය ආදායම් උත්පාදන යෝජනාවක් ලෙස මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමට යෝජනා කිරීම පිළිබඳ ව සභා ලේකම් තුමියට තමා ස්තුති කරන බවත් කාරක සභා අවස්ථාවේදී ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්පකුමාර මැතිතුමා ඉදිරිපත් කළ ළමා උද්‍යානය බුබුල අසලට ගෙන ගොස් එම ස්ථානය ව්‍යාපාරික කටයුතු සඳහා යොදා ගැනීමට සුදුසු බවට තමාද එකග බව පවසා සිටියේය.

එම අවස්ථාවේදී ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා පවසා සිටියේ මෙම බිබිල නගරයේ භූමිය ඵලදායීව නොගත් ස්ථාන ලෙස ළමා උද්‍යානය, ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල, මැණික් ව්‍යාපාරිකයින් සඳහා වෙන් කර ඇති ස්ථානය දැක්විය හැකි බවයි. එබැවින් ඉදිරියේදී ඉලක්ක සහගත සංචාරක නගරයක් උප නගරයක් බවට බිබිල නගරය පත් කිරීම සඳහා සුදුසු ඵලදායී නිවැරදි තීරණ ලබා ගෙන නිශ්චිත ඉලක්ක සහගත සංවර්ධනයක් සිදු කිරීමට සුදුසු ලෙස නිශ්චිත නගර සැලැස්මකට අනුව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව පවසා සිටියේය.

ආදායම් උත්පාදන මාර්ගයක් ලෙසින් ඉදිරිපත් කරන ලද සතොස ගොඩනැගිල්ලේ උඩු මහල ඉදිකිරීම සඳහා වූ යෝජනාව රේඛීය අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන 10ක ආධාරයක් අනුමත වී ඇති බැවින් එම අමාත්‍යාංශය මගින් ප්‍රතිපූරණය කරන තෙක් සභා අරමුදල මගින් මුදල් වැය කර සතොස ගොඩනැගිල්ලේ උඩුමහල ඉදි කිරීමට සුදුසු බව තීරණය කරන ලදී.

මෙම යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.06. බිබිල ප්‍රාදේශීය සභාව ඉදිරිපිට තිබූ ගලවා ඉවත් කරන ලද වැට ළමා උද්‍යානයේ ආරක්ෂිත වැට නොමැති කොටසට සවි කිරීම.**

බිබිල ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යන ළමා උද්‍යානයට නව සෙල්ලම් උපකරණ සවිකර ප්‍රතිසංස්කරණය කර ඇත. නමුත් මෙම ළමා උද්‍යානයේ සංස්කෘතික ගොඩනැගිල්ල දෙසට ඇති කොටසේ ආරක්ෂිත වැට නොමැති අතර එම හේතුවෙන් වැඩිහිටි පුද්ගලයන් ළමා උද්‍යානය තුළට ප්‍රවේශ වී සෙල්ලම් උපකරණ භාවිතා කරන අතර අනාචාර කටයුතු වල නියලෙන බව පෙනී යන බැවින් සෙල්ලම් උපකරණ වල ආරක්ෂාව සඳහා ප්‍රාදේශීය සභාව ඉදිරිපිට තිබූ ගලවා ඉවත් කරන ලද වැට එම කොටසට සවි කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම බිබිල ළමා උද්‍යානයේ සවිකර ඇති සෙල්ලම් උපකරණ සම්බන්ධයෙන් නිරීක්ෂණ මට්ටමේ පවතින බවත් මෙම සෙල්ලම් උපකරණ ප්‍රමිතියකට අනුව සකස් නොකළහොත් දරුවකුට අනතුරක් සිදුවීමට ඉඩ ඇති බැවින් ඒ පිළිබඳව පරීක්ෂා කර බලා ඉතා ඉක්මණින් මෙම ළමා උද්‍යානය ජනතා අයිතියට පත් කිරීමට කටයුතු කරන බව සභාපති තුමා පැවසීය.

ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා මෙම ළමා උද්‍යානයට ගොස් නිරීක්ෂණය කළ බවත් එම උපකරණ සඳහා යොදා ගෙන ඇති බට වල අවිනිශ්චිත බවක් නිරීක්ෂණය වූ බවත් කෙසේ වෙතත් මෙම බිබිල ප්‍රාදේශීය සභාව ඉදිරිපිට තිබූ ගලවා ඉවත් කරන ලද වැට ළමා උද්‍යානයේ ආරක්ෂිත වැට නොමැති කොටසට සවි කිරීමට සුදුසු බව සඳහන් කරමින් අදහස් දැක්වීය.

මෙම අවස්ථාවේදී ගරු මන්ත්‍රී ඒ.එම්. ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් මෙම සෙල්ලම් උපකරණ සවි කිරීම සඳහා කොන්ත්‍රාත්කරු හට මුදල් ගෙවා ඇත්දැයි ප්‍රශ්න කරන ලදී.

එම ප්‍රශ්නය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම අවස්ථාවේදී කොන්ත්‍රාත්කරුවන් සඳහා මුදල් ගෙවා ඇති බවත් එම සවිකිරීම් සඳහා වගකීම් කාලයක් පවතින බවත් සාකච්ඡාවේදි අනාවරණය විය.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රේමතිලක මැතිතුමා ද පවසා සිටියේ මෙම ළමා උද්‍යානයේ සෙල්ලම් උපකරණ අවිනිශ්චිත ස්වභාවයක පවතින නමුත් මෙහි ආරක්ෂාව සඳහා බිබිල ප්‍රාදේශීය සභාව ඉදිරිපිට තිබූ ගලවා ඉවත් කරන ලද වැට ළමා උද්‍යානයේ ආරක්ෂිත වැට නොමැති කොටසට සවි කිරීමට සුදුසු බවයි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.07. ඉන්වෙන්ට්‍රිගත ගබඩා භාණ්ඩ අසුරා තැබීමට ප්‍රමාණවත් ඉඩක් නොමැතිවීම නිසා විධිමත්ව ආරක්ෂිතව පවත්වාගෙන යාහැකි පරිදි පොදු ගබඩාව සකස් කර ගැනීම.

බිබිල ප්‍රාදේශීය සභාවේ ඉන්වෙන්ට්‍රිගත ගබඩා භාණ්ඩ අසුරා තැබීමට තරම් ප්‍රමාණවත් ඉඩක් නොමැතිවීම හේතුවෙන් ආයතන පරිශ්‍රයේ අනාරක්ෂිත ලෙස බොහෝ ස්ථානවල එම භාණ්ඩ ගොඩගසා තැබීමට සිදුව ඇත. එනම්,

- වාහන අංගනය
- පුස්තකාල ගොඩනැගිල්ල අවට
- ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේ 26 හා 27 කාමරවල ද ප්‍රාදේශීය සභා පරිශ්‍රය තුළද එම භාණ්ඩ අවිධිමත්ව ගොඩ ගසා ඇත.

එමෙන්ම පොදු ගබඩාව තුළද රාක්ක නොමැතිවීම හේතුවෙන් හා ඉඩකඩ අවම වීම හේතුවෙන් ඉතාමත් අපිළිවෙලට භාණ්ඩ තැබීමට සිදුව ඇත. තවද සෙනසුරාදා හා ඉරිදා යන දෙදින තුළ කොඩි කණු , කැනපි හා කථන මේසය යනාදිය භාණ්ඩ විෂය භාර නිළධාරියා නොමැතිව නිකුත් කිරීම කලක

සිට සිදුවන අතර එම භාණ්ඩ විටින් විට අස්ථාන ගතවීම් වලට පවා තුඩු දෙන හේතුවක් බවට එම තත්වය පත්ව ඇත.

තවද මුර කුටිය මගින් විෂය භාර නිළධාරියා නොමැති අවස්ථාවල ගබඩා භාණ්ඩ නිකුත් කිරීම හා ආයතනයට නැවත භාර ගැනීම වැනි කටයුතු වලදී සකස් කර දී ඇති ලේඛනවල සටහන් කිරීමකින් තොරව සිදුව ඇති අවස්ථා රැසක්ද නැවත පරීක්ෂා කිරීම් වලදී හමුවී ඇත.

එම තත්වය මත වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයට අනුව ඉන්වෙන්ට්‍රිගත භාණ්ඩ ගණනය කිරීමේදී ගැටළු රැසකට විෂය භාර නිළධාරි හට මුහුණ දීමට සිදුව ඇත. එම නිසා 2025 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට පෙර හෝ මෙම පොදු ගබඩාව විධිමත්ව ආරක්ෂිතව පවත්වා ගෙන යාමට හැකි පරිදි සකස් කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.08. 2024 භාණ්ඩ සමික්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

2024 භාණ්ඩ සමික්ෂණ නිර්දේශ අනුව පහත ලේඛන සකස් කිරිමට අවශ්‍ය වී ඇත.

1. අතිරික්ත භාණ්ඩ ලේඛනයේ සඳහන්ව ඇති භාණ්ඩ, බඩු වට්ටෝරු ලේඛනයට ඇතුලත් කිරිම.
2. භාණ්ඩ හා උපකරණ හඳුනා ගැනීමට පහසු වන ලෙස ලේබල් කිරිම.
3. බඩු වට්ටෝරු ලේඛනයට ඇතුලත් කිරිමේ දි වාහනවල නිවැරදි ලියාපදිංචි අංකය තහවුරු කර ගැනීමෙන් පසුව ලේඛන ගත කිරිම.
4. බඩු වට්ටෝරු ලේඛනයට ඇතුලත් කිරිමේදි එකම වර්ගයේ උපකරණ එක පිටුවක ඇතුලත් කිරිම.
5. බඩු වට්ටෝරු පොතේ සටහන් කිරිමේදි සියළුම උපකරණ වෙන වෙනම පිටුවල සටහන් කිරිම.

ඒ අනුව 2025 භාණ්ඩ සමීක්ෂණයට පෙර මෙම ලේඛණ සැකසීමට අදාල කටයුතු නිම කළයුතු බවත් අංක 05 ලෙස දක්වා තිබෙන සියළුම උපකරණ වෙන වෙනම සටහන් කිරිම සඳහා නව බඩු වට්ටෝරු පොත් සකස් කිරිමට අවශ්‍යව ඇත. ඒ සඳහා අනුමැතියට හා එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.09. ප්‍රධාන පොදු සුසාන භූමියට යන මාර්ගය සහ බෝක්කුව ඉදිකිරීම.**

වැගම ගල්කඩ මූකලාන නිවාසලාභීන් ජීවත් වන නිවාස සංකීර්ණයේ ප්‍රතිලාභීන් ජීවත් වන හා ප්‍රධාන පොදු සුසාන භූමියට යන මාර්ගය මේ වන විට දැඩි ලෙස අබලන්ව ඇති බැවින් එම මාර්ගයට බෝක්කුවක් යොදා ප්‍රතිසංස්කරණය කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.10.හිඟ කුලී මුදල් හා ප්‍රමාද ගාස්තු ගෙවූ A02, A05, B02 කඩ කාමර සම්බන්ධවයි.**

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් A02, A04, A05 ,B02, B03, B05 යන කඩ කාමරවල බදු කරුවන් හිඟ කුලී මුදල් හා ප්‍රමාද ගාස්තු නොගෙවීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා 2025.06.24 දින 05.01.05 යෝජනාව ඉදිරිපත් කරන ලදී. එහිදී තීරණ අංක 05.01.05 මඟින් හිඟ කඩකුලී මුදල් නොගෙවන ලද බදුකරුවන් හට හිඟකුලී මුදල් හා ප්‍රමාද ගාස්තු සති දෙකක කාලය තුළ එනම් 2025.07.21 දින වන විට ගෙවා අවසන් කරන ලෙසට ලිඛිතව දැනුවත් කරන ලෙසට දන්වා ඇත. ඒ අනුව,

2025.07.11 දින වනවිට

- A02 - එච්.එම්. බෝධිවංශ ගුණසේකර මයා
- A05 - වයි.එම්. ශාන්ත කුමාර මයා
- B02 - කේ.පී. අල්විස් මයා

යන බදුකරුවන් හිඟ කුලී මුදල් හා ප්‍රමාද ගාස්තු ගෙවා අවසන් කර ඇත. මෙම කඩ කාමර 2025 මාර්තු මස දක්වා කුලී මුදල් ගෙවීම් කර අවසන් කර ඇති අතර මෙම කඩ කාමර සඳහා 2025 අප්‍රේල් මස සිට බිල් කිරීම්ද නවතා ඇති බැවින් මෙම A02, A05, B02 බදුකරුවන්ගෙන් 2025 අප්‍රේල් මාසයේ සිට හිඟ ගාස්තු සහ ප්‍රමාද ගාස්තු අයකර නව ගිවිසුම් වලට එළඹ එම බදුකරුවන්ටම බදු ලබාදීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී එම යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ජේ.ඒ.පී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් A02, A05, B02 යන කඩකාමර හිමි බඳුකරුවන් 2025.07.11 දින වන විට 2025 අප්‍රේල් මාසය දක්වා ගෙවීමට තිබූ හිඟ කුලී මුදල් හා ප්‍රමාද ගාස්තු ගෙවා ඇති නමුත් නැවතත් අප්‍රේල් මාසයේ සිට මේ දක්වා ඇති හිඟ කුලී මුදල් හා ප්‍රමාද ගාස්තු අයකර නව ගිවිසුම් වලට එළඹ මෙම බඳුකරුවන් හටම මෙම කඩ කාමර බඳු ලබාදීම විගණනයට පවා බඳුන්විය හැකි බැවින් මෙම යෝජනාව මුදල්හා ප්‍රතිපත්ති කමිටුවට ඉදිරිපත් කර ඊළඟ සභාවට ඉදිරිපත් කිරීමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට ඉදිරිපත් කර නැවත ඊළඟ සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>05.01.11. බිබිල සතිපොළ E කඩ කාමර සම්බන්ධවයි.</u>**

බිබිල ප්‍රාදේශීය සභාව සතු බිබිල සතිපොළ ගොඩනැගිල්ලේ E කඩ කාමර 13ක් ඇති බවත් එම කඩකාමරවල ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට ආසන්නව ඇති බවත් එම කඩ කාමර ටෙන්ඩර් කිරීමෙන් පසු ලැබෙන කීමනි මුදලින් අදාළ කඩ කාමරවල වැඩ අවසන් කිරීම සුදුසු බවටත් 2025.06.30 දිනැතිව ආදායම් පරීක්ෂක මහතා විසින් ලිඛිතව දැනුවත් කර ඇත. ඒ අනුව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරුවක් ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් අනුමත කර ඇත.

බිබිල සතිපොළ E කඩකාමර 11ක් සඳහා පමණක් බඳු ගිවිසුමක් ඇති අතර E12 සහ E13 කඩ කාමර සඳහා ගිවිසුම් නොමැත. එසේම මෙම කඩකාමර සඳහා කීමනි මුදල සහ මාසික කුලී මුදල තීරණය කිරීමට නම් මෙම කඩ කාමර බඳු ලබාදෙනු ලබන කාලය කොපමණද යන්න තීරණය කළ යුතුයි.

මෙම කඩ කාමර වසර 03කට වඩා වැඩි කාලයක් සඳහා බඳු ලබා දෙන්නේ නම් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19 (XII) වගන්තිය අනුව විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය වේ.

2013 ජුනි 28 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පොදු හා පෞද්ගලික වෙළඳපොළවල් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාවේ 41 වගන්තියේ (iii) අනුව පැරණි වෙළඳපොළ ගොඩනැගිල්ලක් පැවති ස්ථානයක නව වෙළඳසැලක් ඉදිකළ පසු පැරණි වෙළඳසැලෙහි බඳුකරුවන් විසින් එම ගොඩනැගිල්ලෙන් කඩකාමර ඉල්ලා සිටින්නේ නම් ඔවුන් වෙත එම කඩ කාමර ලබා දියයුතුය.

මෙම කඩ කාමර ටෙන්ඩර් කිරීමේදී ලබා ගනු ලබන කීමනි මුදලින් කාමරවල වැඩ අවසන් කරන්නේ නම් කඩ කාමරවල ඉදිකිරීම් අවසන් කර බඳුකරුවන්ට භාර දෙනු ලබන්නේ කොපමණ කාලසීමාවකින්ද යන්න බඳුකරු දැනුවත් කිරීමක්ද සිදුකළ යුතුය.

මේ අනුව මෙම E කඩ කාමර බදු ලබාදීම සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී එම යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම E කඩ කාමර බදු ලබාදීම සම්බන්ධ යෝජනාව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට ඉදිරිපත් කර නැවත ඊළඟ සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

E කඩ කාමර බදු ලබාදීම සම්බන්ධ යෝජනාව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට ඉදිරිපත් කර නැවත ඊළඟ සභාවට ඉදිරිපත් කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>05.01.12 බිබිල පොදු වෙළඳපොල A16 කඩ කාමරය සම්බන්ධවයි.</u>**

බිබිල ප්‍රාදේශීය සභාව සතු බිබිල පොදු වෙළඳපොල A16 කඩ කාමරය සුන්දර බේක් හවුස් , පොදු වෙළඳපොල , බිබිල ලිපිනයේ එච්.එම්. කරුනාසුන්දර යන අය විසින් බදු ලබාගෙන ඇත. 2022 වර්ෂයේ දෙසැම්බර් මාසයේ මෙම කඩ කාමරයේ බිත්ති පුපුරා ගොස් අබලන් තත්වයට පත්ව ඇති බැවින් ව්‍යාපාරික කටයුතු සිදුකිරීමට නොහැකි වූ බවත් එම ආදායම් අහිමි වූ බැවින් මෙම කඩ කාමරය වසා තැබූ කාලසීමාව සඳහා කුලී මුදල් සඳහා සහනයක් ලබා දෙන ලෙස මෙම බදුකරු විසින් ඉල්ලීමක් කර ඇත.

ඒ අනුව එම බදුකරු සහන අපේක්ෂා කිරීමට ඉදිරිපත් කරන ලද කරුණුවල සාධාරණත්වය පිළිබඳ සලකා බලා එවකට බිබිල ප්‍රාදේශීය සභාවේ 2023.01.05 දින පවත්වන ලද මාසික මහා සභාවේදී , 2022.12.31 දින වන විට එම කඩ කාමරය සඳහා හිඟ කුලී මුදල් ලෙස ගෙවීමට ඇති රු.5000.00 මුදල නිදහස් කිරීමට අංක 05.01.09 මගින් තීරණය කරන ලදී.

ඒ අනුව මෙම කඩ කාමරයේ අබලන් තත්වය හේතුවෙන් බදු කුලියෙන් අත්හැරීමට තීරණය කරන ලද රු.5000.00 ක මුදල කපා හැරීම සඳහා 2023.04.10 හා 2023.08.04 දිනැතිව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කළද මෙම කුලී මුදල් කපා හැරීම සම්බන්ධයෙන් කිසිදු දැනුම් දීමක් සිදු කර නොමැති බැවින් ඒ සඳහා සුදුසු තීරණයක් ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී එම යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

බිබිල පොදු වෙළඳපොලෙහි A16 කඩ කාමරයේ බිත්ති පුපුරා අබලන් තත්වයට පත්ව ඇති බැවින් වසා තැබූ කාලසීමාව සඳහා ගෙවීමට ඇති රු.5000.00ක මුදල කපාහැරීම පිළිබඳව,

- බඳුකරු මෙම ඉල්ලීම කර ඇති දිනය
- එම දිනය වනවිට වසා තිබුණාද ?
- එදා සිට මේ දක්වා වසා තිබේද ?
- එම කඩ කාමරයේ සත්‍ය වශයෙන් ප්‍රශ්නයක් තිබේ නම් එම ඉදි කිරීමට කාර්මික නිළධාරි විශාල වියදමක් ඉදිරිපත් කළේ නම් එසේ ඉදි කිරීම් නොකළ බව
- මෙම මුදල් කපාහැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලීම් කළ දිනය
- ගරු ආණ්ඩුකාරතුමා මේ සඳහා අනුමැතිය මේ තරම් කාලයක් නොදී ඇත්තේ ඇයි ?
- නැවත සිහිකැඳවීමක් කර ගරු ආණ්ඩුකාරතුමාගෙන් තොරතුරු ඉල්ලීම් කර තොරතුරු ලබා ගෙන

වාර්තාවක් සකස් කර නැවත මහ සභාවක් සඳහා ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී.

එම යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>05.01.13. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් එළවළු කඩ කාමර සම්බන්ධවයි.</u>**

බිබිල ප්‍රාදේශීය සභාව සතු බිබිල එළවළු කඩ කාමර 18 ක් ඇත.මෙම කඩ කාමර සියල්ල බදු ලබා දී ඇති අතර මාසික කුලී මුදල ලෙස රු.1200.00 ක මුදලක් අය කරනු ලැබේ. මෙම කඩ කාමර පවතින ස්ථානය වාහන නැවතුම්පොලක් සඳහා භාවිතා කිරීමට පසුගිය ප්‍රාදේශීය සංවර්ධන කමිටුවලදී සාකච්ඡා වූ බැවින් 2025 මාර්තු මස සිට බිල් කිරීමද නතර කරන ලදි.

මෙම කඩ කාමර සඳහා බිල් කිරීම නතර කරනු ලැබුවද මේ සම්බන්ධයෙන් බඳුකරුවන් ලිඛිතව දැනුවත් කිරීමක් හෝ බදු ගිවිසුම් අවලංගු කිරීමක් සිදුකර නොමැත. මේ සම්බන්ධයෙන් 2025.05.30 දිනැතිව ආදායම් පරීක්ෂක මහතාගෙන් වාර්තාවක් හා අවශ්‍ය නිර්දේශ ලබාදෙන ලෙස දන්වා සිටින ලදී.

මේ සම්බන්ධයෙන් ආදායම් පරීක්ෂක මහතාගේ 2025.07.04 දිනැති වාර්තාව මගින්,
කඩ කාමර වල කුලී අය කිරීම නතර කරන්නේ නම් ඊට පෙර ගිවිසුම අවලංගු කළයුතු බවත් නිශ්චිත ඉදිරි දිනයක් සඳහන් කර එදින සිට ගිවිසුම අවලංගු කළයුතු බවත් එදින සිට කුලී අය නොකරන බවත් බඳුකරු වෙත දැන්විය යුතු බවත් මේ සම්බන්ධයෙන් නැවත සභාවට යොමුකර එම ස්ථානයේ වාහන නැවතුම්පලක් ඉදිකිරීමට නියමිත බැවින් ඒ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග කවරේද යන්න තීරණය කර ඒ අනුව කටයුතු කිරීම සුදුසු බව නිර්දේශ කර ඇත.

ඒ අනුව මෙම කඩ කාමර සම්බන්දයෙන් සුදුසු තීරණයක් ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී එම යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බිබිල එළවළු කඩකාමර 18හි හිමිකරුවන් හට බිබිල සතිපොළ භූමියෙහි ද කඩකාමර හිමිව ඇත. එම නිසා මෙම එළවළු කඩ කාමර සඳහා මාර්තු මාසයේ සිට මේ දක්වා හිඟ කඩකුලී අය කර ගැනීමට කටයුතු කිරිමටත් ඒ අය එම ස්ථානයෙන් ඉවත් කර සති පොළට විතැන් කර ගිවිසුම් අවලංගු කර එම ස්ථානය වාහන නැවතුම්පොළක් ඉදිකිරීමට සුදුසු බවත් තීරණය කරන ලදී.

එම යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>05.01.14. බිබිල පොදු වෙළඳපොල කඩ කාමර තක්සේරුව සම්බන්ධවයි.</u>**

බිබිල ප්‍රාදේශීය සභාව සතු බිබිල පොදු වෙළදපොල කඩ කාමර 2021.07.20 දිනැති තක්සේරු වාර්තාවට අනුව කුලී මුදල් අය කිරීම 2022 ජනවාරි මස සිට සිදුකර ඇත. ඒ අනුව මේ වන විට තක්සේරුවට අනුව කුලී මුදල් අය කිරීම 2025 ජනවාරි මස වන විට වසර 03 ක කාලයක් ගතව ඇත.

2013 ජුනි 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ IV (අ) වැනි කොටසේ පළාත් සභා පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථාවේ පොදු හෝ පෞද්ගලික වෙළඳපළවල් සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථාවේ 34 වැනි වගන්තියේ (III)වැනි ඡේදයෙහි කඩ කාමර බදු කුලී මුදල් සම්බන්ධයෙන් පහත පරිදි සඳහන් වේ.

**"යටත් පිරිසෙයින් පස් වසරකට වරක් හෝ සභාව තීරණය කරන පස් වසරකට අඩුවන කාලයකට වරක් තක්සේරු බදු මුදල රජයේ ප්‍රධාන තක්සේරුගේ තක්සේරුව මත සංශෝධනය කළ යුතුය."**

එසේම පොදු වෙළඳපොල බදු ගිවිසුම් පත්‍ර තුල බදු කුලී මුදල තක්සේරු කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් වගන්ති ඇතුලත් වේ.

1. මොනරාගල සංවර්ධන සභාවට අයත් වෙළඳපොල ගොඩනැඟිලි බදු දීමේ ගිවිසුම් පත්‍රය තුල මාසික කුලී මුදල සම්බන්දයෙන් පහත වගන්තිය ඇතුලත්වේ.

**"සෑම වර්ෂ පහක කාල සීමාවකට පසු ඉහත සඳහන් මාසික කුලී මුදල පළමුවෙනි පක්ෂය විසින් සංශෝධනය කිරීමට බලය තිබිය යුතු අතර, එකී දෙවෙනි පක්ෂය විසින් එකී සංශෝධිත එකී මුදල එපරිද්දෙන්ම ගෙවිය යුතුය"**

2. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් පොදු වෙළඳපොල කඩ කාමර බදු දීමේ ගිවිසුම් පත්‍රය තුල පහත පරිදි සඳහන්වේ.

**" වසර පහකට වරක් හෝ පස්වසරකට අඩු කාලයකට වරක් මාසික බදු කුලිය ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ප්‍රතිශෝධනය කිරීමට සභාවට බලය ඇත. සභාව විසින් නියම කරනු ලබන දින සිට එසේ ප්‍රතිශෝධනය කරනු ලබන මාසික කුලිය බදුකරු විසින් ගෙවිය යුතුය."**

මේ අනුව මෙම කඩ කාමර කුලී මුදල් තක්සේරු කිරීම සම්බන්දයෙන් සුදුසු තීරණයක් ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී එම යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම පොදු වෙළඳපල කඩ කාමර වසර 03ක කාලයක් දක්වා තක්සේරු කිරීමට සුදුසු බව තීරණය කරන ලදී.

එම යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට නැවතත් මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම අවස්ථාවේ දී තක්සේරු කිරීමේදී ප්‍රදේශය, ස්ථානය, ජනගහණය පිළිබඳව සළකා බලා තක්සේරු නිළධාරීන් විසින් තක්සේරු කළයුතු බව හා බදුකරුවන් ප්‍රාදේශීය සභාවට අඩු කුලියක් ගෙවා අතුරු බදු දී බදුකරුවන් විසින් වැඩි ආදායමක් උපයා ගැනීම පිළිබඳව සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම සාකච්ඡාවෙන් අනතුරුව අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.15. මැද කුරගම්මන මාර්ගය කොන්ක්‍රීට් කිරීම.**

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් මැද කුරගම්මන මාර්ගය වාහන හා මහජනතාවට ගමන් කිරීමට නොහැකි ලෙසම අබලන් වී ඇති බව මැද කුරගම්මන ගම්වාසීන් මා වෙත දන්වා ඇත. එම මාර්ගය කොන්ක්‍රීට් කර ප්‍රතිසංස්කරණය කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

වැගම කෙහෙල්අත්තාවල ග්‍රාම නිළධාරි වසමට අයත් මෙම කුරගම්මන මාර්ගයේ මීටර් 200ක් වැනි කොටසක් කොන්ක්‍රීට් කිරීමට අවශ්‍ය බවත් එම මාර්ගය එම මාර්ගය පවුල් 150ක් 200ක් පමණ ප්‍රමාණයක් භාවිතා කරන බැවිනුත් එම මාර්ගය කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට අදහස් දක්වමින් එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.16. 2026 වර්ෂය සඳහා බිබිල ප්‍රාදේශීය සභාව සතු දේපල ප්‍රසම්පාදන මගින් බදු දීම**

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් දේපල වාර්ෂිකව ප්‍රසම්පාදන මගින් බදු දෙනු ලබයි. ඒ අනුව 2026 වර්ෂය සඳහා ප්‍රසම්පාදන මගින් බදු ලබාදෙන දේපල පහත පරිදි වේ.

| අනු අංකය | **දේපල** | **2025 වාර්ෂික බදු මුදල** |
|---|---|---|
| 01 | බිබිල සතිපොළ | 2,822,222.28 |
| 02 | පිටකුඹුර සතිපොළ | 270,600.00 |
| 03 | බිබිල එළගව මස් වෙළඳසැල | 2,006,000.00 |
| 04 | අංක 01 මුහුදු මාළු වෙළඳසැල | 1,047,000.00 |
| 05 | අංක 02 මුහුදු මාළු වෙළඳසැල | 518,000.00 |
| 06 | අංක 03 මුහුදු මාළු වෙළඳසැල | 947,000.00 |
| 07 | මිරිදිය මාළු වෙළඳසැල | 347,000.00 |
| 08 | ඌරු මස් වෙළඳසැල | 690,000.00 |
| 09 | කරවල වෙළඳ සැල | ඉල්ලුම් කර නැත |
| 10 | අංක 01 කුකුළු මස් වෙළඳසැල | 763,000.00 |
| 11 | අංක 02 කුකුළු මස් වෙළඳසැල | ඉල්ලුම් කර නැත |
| 12 | අංක 03 කුකුළු මස් වෙළඳසැල | 510,100.00 |
| 13 | උඩුබුබුල විවේකාංගනය | 78,240.00 |
| 14 | බස්නැවතුම්පොළ අසල වැසිකිලිය | 300,050.00 |
| 15 | බිබිල සතිපොළ අසල වැසිකිලිය | ඉල්ලුම් කර නැත |

- අංක 02 කුකුළු මස් වෙළඳසැල /බිබිල සතිපොළ අසල වැසිකිලිය සහ කරවල වෙළඳසැල සිව් වතාවක් ප්‍රසම්පාදනය කළ නමුත් ප්‍රසම්පාදනය වී නැත. අංක 01 කුකුළුමස් වෙළඳසැල 2025.04.30 දින සිට නැවත සභාවට භාර දී ඇත. ඒ අනුව එම වෙළඳසැල නැවත වරක් ප්‍රසම්පාදනය කළ නමුත් ප්‍රසම්පාදනය නොවුනි.

**මෙම වෙළද සැල් සඳහා 2025 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද අවම ලංසුව හා එම වෙළඳසැල් බදුකරුවන් විසින් ඉල්ලුම් කළ වැඩිම වාර්ෂික බදු මුදල පහත පරිදි වේ.**

| අනු අංකය | දේපල | අවම ලංසුව (2025 වර්ෂයේ තක්සේරු වටිනාකම) | 2025 ඉල්ලුම් කළ වැඩිම මුදල | වෙනත් |
|---|---|---|---|---|
| 1 | බිබිල සතිපොළ | 1,800,000.00 | 2,822,222.28 | - |
| 2 | පිටකුඹුර සතිපොළ | 270,000.00 | 270,600.00 | - |
| 3 | බිබිල එළ ගවමස් වෙළඳසැල | 2,000,000.00 | 2,006,000.00 | - |
| 4 | අංක 01 මුහුදු මාළු වෙළඳසැල | 1,045,000.00 | 1,047,000.00 | - |
| 5 | අංක 02 මුහුදු මාළු වෙළඳසැල | 516,000.00 | 518,000.00 | - |
| 6 | අංක 03 මුහුදු මාළු වෙළඳසැල | 945,000.00 | 947,000.00 | - |
| 7 | මිරිදිය මාළු වෙළඳසැල | 345,000.00 | 347,000.00 | - |
| 8 | ඌරු මස් වෙළඳසැල | 687,500.00 | 690,000.00 | - |
| 9 | කරවල වෙළඳසැල | 58,000.00 | 00 | මෙම වෙළඳසැල සිව් වතාවක් ප්‍රසම්පාදනය කළ නමුත් ප්‍රසම්පාදනය වී නැත |
| 10 | අංක 01 කුකුළු මස් වෙළඳසැල | 473,000.00 | 651,500.00 | 2025 .04.30 දින සිට නැවත සභාවට භාර දී ඇත |
| 11 | අංක 02 කුකුළු මස් වෙළඳසැල | 470,000.00 | 00 | මෙම වෙළඳසැල සිව් වතාවක් ප්‍රසම්පාදනය කළ නමුත් ප්‍රසම්පාදනය වී නැත |
| 12 | අංක 03 කුකුළු මස් වෙළඳසැල | 420,000.00 | 510,100.00 | - |
| 13 | උඩුබුබුල විවේකාංගනය | 78,000.00 | 78,240.00 | - |
| 14 | බිබිල සතිපොළ අසල වැසිකිලිය | 60,000.00 | 00 | මෙම වැසිකිලිය සිව් වතාවක් ප්‍රසම්පාදනය කළ නමුත් ප්‍රසම්පාදනය වී නැත |

| | | | | |
|---|---|---|---|---|
| 15 | බස් නැවතුම්පොළ පොදු වැසිකිළිය | 300,000.00 | 300,050.00 | - |

මෙම උක්ත දේපල 2026 වර්ෂය සඳහා ප්‍රසම්පාදනය කර බදු ලබා දීමට අනුමැතිය ලබාදීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

මෙම දේපළවල අවම ලංසුව සඳහා තක්සේරු වටිනාකම සඳහා 5% ක බදු මුදලක් එක්කර ඇත් දැයි ගරු මන්ත්‍රී පී.කේ.ඩී.පුෂ්පකුමාර මැතිතුමා විසින් විමසා සිටින ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට නැවතත් මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.එම්. ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේ එම යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී පී.කේ .ඩී. පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට ඉදිරිපත් කර නැවත ඊළඟ සභාවාරය සඳහා ඉදිරිපත් කිරීමට සුදුසු බව ගරු උප සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාව සතු දේපල 2026 වර්ෂය සඳහා ප්‍රසම්පාදනය මගින් බදු ලබාදීමේදී මෙම දේපල වල අවම ලංසුව සඳහා (2025 වර්ෂයේ තක්සේරු වටිනාකම) බද්දක් එකතු කර වටිනාකම වැඩි කරන්නේද තිබෙන ලංසුව යටතේම බදු ලබා දෙන්නේද සමාජ සුභ සාධනය සඳහා යොදවන්නේද යන්න මුදල් හා ප්‍රතිපත්ති කමිටුව මගින් සාකච්ඡා කර නැවත ඊළඟ සභා වාරය සඳහා ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී.

එම යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>05.01.17. බිබිල සම්පත් මධ්‍යස්ථානයේ හිඟ කුලී මුදල් ගෙවීමෙන් නිදහස් කිරීම.</u>**

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ඉඩමක බිබිල සම්පත් මධ්‍යස්ථානය වර්ල්ඩ් විෂන් ලංකා ආයතනය මගින් ඉදිකර අවුරුදු 12 ක කාලයක් ගිවිසුම් ප්‍රකාරව එම ආයතනය මගින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානයක් ලෙස සභාවට කුලී නොගෙවා පවත්වාගෙන යන ලදී. 2024 සැප්තැම්බර් මස සිට ගිවිසුම අවලංගු වී ඇති නමුත් බිබිල ප්‍රදේශීය සභාව වෙත භාර නොදී මේවන තෙක්ම එම ආයතනය සම්පත් මධ්‍යස්ථානය භාවිතා කරනු ලබයි.

ගිවිසුම අවලංගුව තිබියදී 2024 සැප්තැම්බර් මස සිට 2025 සැප්තැම්බර් මස දක්වා කුලියක් ගෙවීම සඳහා එම ආයතනය අරමුදල් වෙන්කර ගෙන නොමැති බැවින් එම කාලසීමාව සඳහා ගෙවීමට ඇති කුලී මුදලින් නිදහස් කරන ලෙස වර්ලඩ් විෂන් ලංකා ආයතනය ඉල්ලීම් කර ඇති බැවින් ඒ පිළිබඳ සාකච්ඡා කර සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට නැවතත් මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේ එම යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්. රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාව සතු මෙම සම්පත් මධ්‍යස්ථානය වර්ල්ඩ් විෂන් ලංකා ආයතනය සමඟ ගිවිස ගෙන ඇති ගිවිසුම 2024 වර්ෂයේ සැප්තැම්බර් මස අවසන් වී ඇති බැවින් 2024 සැප්තැම්බර් මස සිට 2025 සැප්තැම්බර් මස දක්වා කුලී ගෙවීම සඳහා එම ආයතනය මුදල් වෙන් කරගෙන නොමැති බැවින් එම කාලය සඳහා කුලී මුදල් ගෙවීම නිදහස් කරන ලෙස කර ඇති ඉල්ලීම නිසා එම සම්පත් මධ්‍යස්ථාන ගොඩනැගිල්ලෙහි වර්ල්ඩ් විෂන් ලංකා ආයතනය බිබිලේ දරුවන්ගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික දැනුම දියුණු කිරීමේ සත්කාරය සඳහා යොදා ගන්නා බැවින් එම ආයතනය සඳහා කුලී ගෙවීමේ සහන කාලය ලෙස 2024 සැප්තැම්බර් මස සිට2025 ජූලි 22 දින දක්වා ලබාදීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙසත් වර්ල්ඩ් විෂන් ලංකා ආයතනයට මෙම ගොඩනැගිල්ල සඳහා 2025 ජූලි 22 දින සිට මාසික තක්සේරු කුලිය වන රු.82000.00 ක මුදල මාසිකව ගෙවීම් කිරීමට කටයුතු කරන ලෙස දන්වා යැවීමට හා මෙම කුලී මුදල් නිදහස් කිරීම සඳහාගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙසත් රු.82000.00 ක මාසික තක්සේරු කුලියකට වසර 03 ක කාලයක් සඳහා වර්ල්ඩ් විෂන් ලංකා ආයතනයට බදු දීමට ගරු ආණ්ඩුකාරවර අනුමැතියට ඉදිරිපත් කර ඇති බව එම ආයතනය දැනුවත් කරන ලෙසත් තීරණය කරන ලදී.

එම යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>05.01.18. බිබිල මහජන පුස්තකාලයේ වාර්ෂික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හා උපදේශන කමිටුව පත් කිරීම.</u>**

2025 වාර්ෂික සැලැස්මට අනුව ජාතික කියවීමේ මාසයට සමගාමීව බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පාසල් දෙකක් අතර විවාද තරගයක් අදාල වැය ඇස්තමේන්තුවට අනුව පැවැත්වීම සඳහා හා 2025 වර්ෂය සඳහා බිබිල මහජන පුස්තකාලයේ උපදේශන කමිටුව නැවත පත් කිරීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් පුස්තකාල උපදේශන කමිටුව ලෙස පහත මන්ත්‍රී මණ්ඩලය හා සම්පත් ධායකයින් සුදුසු බව යෝජනා කරන ලදී.

01.වී සරත් විදානගම මැතිතුමා - ගරු සභාපති
02.එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා - ගරු මන්ත්‍රී

03.ඩබ්.එම්.රූපසේන මැතිතුමා - ගරු මන්ත්‍රී
04.ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා - ගරු මන්ත්‍රී
05.පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා - ගරු මන්ත්‍රී
06.ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා - ගරු මන්ත්‍රී
07.ටී.එම්.අබේගුණසේකර මයා - ප්‍රජා සංවර්ධන නිළධාරි
08.වී.එම්.විජයලතා මිය - පුස්තකාලාධිපති
09.ටී.එම්.අමිල නුවන් මයා - පාසල් ගුරු
10.ඩී.එම්. රුවන් සංජය මයා -
11.ආර්.එම්.ශාන්ති කුමාරි මිය -
12.එස්.එම්.චාරුලතා ඉන්දීවරී මිය - පාසල් ගුරු
13.ටී.ඩබ්.එම්.ජයසිංහ මයා - සංචාරක උපදේශක
14.ඩබ්.එම්.පී.වනිගසේකර මයා -

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.19. ප්‍රසම්පාදන කමිටුව පත් කිරීම**

2025.06.24 දිනැති මාසික සභා රැස්වීම් වාර්තාවේ 05.01.07 අංක දරණ සභා තීරණය මගින් පත්කරන ලද පහත නම් හා තනතුර සඳහන් මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභා සාමාජිකයන් ප්‍රසම්පාදන කමිටුව ලෙසද පත්කිරීමට සඳහා හා පහත පරිදි ඔවුන්ගේ කාර්යභාරයන් ඉටුකළ යුතු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අ.අ. | නම | තනතුර | කමිටු තනතුර |
|---|---|---|---|
| 01 | වී.සරත් විදානගම මයා | ගරු සභාපති | සභාපති |
| 02 | ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මයා | ගරු මන්ත්‍රී | සාමාජික |
| 03 | ඩබ්.එම්.රූපසේන මයා | ගරු මන්ත්‍රී | සාමාජික |
| 04 | ඩී.එම්.ශ්‍රියානි මංගලිකා ජයලත් මිය | ගරු මන්ත්‍රී | සාමාජික |
| 05 | ආර්.බී.ප්‍රේමතිලක මයා | ගරු මන්ත්‍රී | සාමාජික |
| 06 | එල්.ඒ.බී.චින්තිකා හර්ෂනී මිය | ගරු මන්ත්‍රී | සාමාජික |
| 07 | ඩී.ඒ.නිශාන්ත අමරතුංග මයා | ගරු මන්ත්‍රී | සාමාජික |
| 08 | ඒ.එම්.හේමරත්න බංඩාර මයා | විශ්‍රාමික සභා ලේකම් | සාමාජික |
| 09 | ඩබ්.ඒ.හර්බට් රත්නායක මයා | විශ්‍රාමික බැංකු ක්ෂේත්‍ර නිලධාරි | සාමාජික |
| 10 | කේ.එච්.එම්.විජේරත්න මයා | විශ්‍රාමික බැංකු කළමනාකරු | සාමාජික |
| 11 | එම්.ජෝතිපාල මයා | ප්‍රවීන ඉංග්‍රීසි ගුරු | සාමාජික |

ප්‍රසම්පාදන කමිටුවේ කාර්යභාරය

- මුදල් හා ප්‍රතිපාදන ඇති බව තහවුරු කර ගැනීම
- ප්‍රසම්පාදන ක්‍රමය, ලංසු ආරාධනා කරන දිනය, ලංසු විවෘත කිරීමේ දිනය තීරණය කිරීම
- ලංසු ලේඛන සම්බන්ධ තාක්ෂණික ඇගයීම් කමිටු හා එකඟ වීම

- තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් පැහැදිලි කිරීම් ලබා ගැනීම
- තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ හා වාර්තා ඇගයීම
- ලංසුකරුවන් සමඟ සාකච්ඡා කිරීම
- ලංසු ප්‍රදානය සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීම

එම යෝජනාව ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ සාමාජිකයින් අතරින් ප්‍රසම්පාදන කමිටුව සඳහා පහත ගරු සභාපතිතුමා ඇතුළු මනත්‍රී මණ්ඩලය සුදුසු බව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා යෝජනා කරන ලදී.

01.වී සරත් විදානගම මැතිතුමා - ගරු සභාපති
02.ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා - ගරු මන්ත්‍රී
03.ඩබ්.එම්.රූපසේන මැතිතුමා - ගරු මන්ත්‍රී
04.ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා - ගරු මන්ත්‍රී
05.ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා - ගරු මන්ත්‍රී

එම ප්‍රසම්පාදන කමිටුව පත් කිරීමේ යෝජනාව හා ඔවුන්ගේ කාරයභාරයන් ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.02. ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා.

### 05.02.01. පාසල් ළමුන් සඳහා නව බස්රථ සේවාවක් ලබා ගැනීම සම්බන්ධවයි.

පොදු ප්‍රවාහන සේවයක් නොමැතිවීම නිසා පිටකුඹුර දියකොළේයාය සිට පිටකුඹුර ද්විතීයික හා ප්‍රාථමික විදුහල දක්වා කි.මී.5ක් පමණ දුරක් සිසුන් 50ක් පමණ පිරිසක් දැඩි අපහසුතාවයට පත්ව ඇති අතර දෙමව්පියන්ද දැඩි ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටින පිරිසකි. එබැවින් පාසල් ළමුන් පාසල කරා රැගෙන ඒමට සහ පාසල ඇරී නැවත නිවෙස් කරා රැගෙන යාමට නව බස් රථ සේවාවක් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේම තිලක මැතිතුමා විසින් ගරු ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමාගේ යෝජනාවට එකඟ බවත් නමුත් මෙම මාර්ගය බස් රථයක් ගමන් කිරීමට නොහැකි ලෙස අබලන්ව හා මාර්ගය දෙපස ඇති ගස් මාර්ගය දෙසට නැවී ඇති බැවින් බස් රථයක් ගමන් කිරීමට නොහැකි බවයි. එබැවින් බස්රථයක් යෙදවීමට පෙර මාර්ගය සංවර්ධනය කිරීම සිදු කළ යුතු බවත් තමා මේ වනවිට එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ගරු සභාවට යෝජනා කර ඇති බවත්ය.

ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා විසින් මෙම මාර්ගයේ බස් රථයක් ගමන් කිරීමට හැකි බවත් මෙම මාර්ගය දෙපසින් පාරට නැවී ඇති අතු ප්‍රජා සහභාගිත්වයෙන් ඉවත් කිරීමට තමා වගකීමෙන් භාර ගන්නා බවත් පවසා සිටින ලදී.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ් එම්.එම්. අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා හට පාර දෙපසින් පාරට නැවී ඇති අතු ප්‍රජා ධායකත්වයෙන් කපා ඉවත් කර සුද්ධ කරන ලෙසත් සභාවේ මෝටර් ග්‍රේඩරය යොදා ගෙන මාර්ගය කපා ප්‍රතිසංස්කරණය කිරීමටත් ඉන් පසුව පිටකුඹුර ද්විතීයික පාසලේ සිට දියකෙළේයාය ප්‍රජා ශාලාව දක්වා පාසල් ළමුන් ප්‍රවාහනය කිරීම සඳහා මෙම මාර්ගයේ බස් රථ සේවාවක් යෙදවීම සඳහා ඩිපෝ කළමණාකරුගෙන් ඉල්ලීමක් කිරීමට තීරණය කරන ලදී.

එම යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.02.02. පිටකුඹුර කොට්ඨාසයේ මොටර්ග්‍රේඩර් භාවිතා කර සංවර්ධනය කළයුතු මාර්ග හා ඉදිකළ යුතු බොක්කු සම්බන්ධවයි.</u>

පිටකුඹුර කොට්ඨාසයට අයත් පහත සඳහන් මාර්ග,
01.හාමාපොල වසමෙහි වෙළගදේව මරණාධාර සමිති ශාලාව අසල සිට අශෝක මහතාගේ නිවස පිහිටි මාර්ගය ( කි. මී.1/2ක් )
02. හාමාපොල වසමෙහි වෙළගදේව මරණාධාර සමිති ශාලාව ළඟ සිට හැළඹ මාර්ගය හා අතුරු මාර්ග
03. හාමාපොල වසමෙහි සුද්ධ මුදලාලි මහතාගේ නිවස අසල සිට බෙල්ලන්වෙල උයන්කුඹුර මාර්ගය
04.හාමාපොළ වසමෙහි තල්ලන්ද ප්‍රධාන මාර්ගයේ පේමදාස මහතාගේ නිවස ළඟ සිට මහවෙලේවත්ත මාර්ගය
05. හාමාපොළ වසමෙහි උයන්කුඹුර ප්‍රධාන මාර්ගයේ සිට මාතුපාල මහතාගේ නිවස පිහිටි අතුරු මාර්ගය
06. හාමාපොළ වසමෙහි උයන්කුඹුර ප්‍රධාන මාර්ගයේ සිට උඩකඳුර අතුරු මාර්ගය
07. හාමාපොළ වසමෙහි දයා මුදලාලි මහතාගේ නිවස අසළ සිට මහවෙල් යාය අතුරු මාර්ගය
08. හාමාපොළ පලලියද්ද මාර්ගය
09. හාමාපොළ වසමෙහි පල්ලියද්ද මාර්ගය
10.තොටිල්ලකැටිය වසමෙහි දියකොලේයාය ප්‍රජාශාලාව අසල සිට ඉනොල්දෙණිය මාර්ගය
11. තොටිල්ලකැටිය වසමෙහි දියකොළේයාය ප්‍රධාන මාර්ගයේ සිට ගැටහවෙල අතුරු මාර්ගය
12. තොටිල්ලකැටිය වසමෙහි අඹගොම්මන මාර්ගය
13. තොටිල්ලකැටිය වසමෙහි බුරුතඅත්තාදෙන මාර්ගය
14. පිටකුඹුර වසමෙහි කන්දේවිහාර පාසල් හන්දියේ සිට ජන උදාන ගම්මාන මාර්ගය
15. පිටකුඹුර වසමෙහි විලැතිගොඩ මාර්ගය

මෝටර්ග්‍රේඩර් කර සංවර්ධනය කිරීමට හා

01.තොටිල්ලකැටිය වසමෙහි අඹගොම්මන ගිලා බැස ඇති බෝක්කුව
02.තොටිල්ලකැටිය වසමෙහි ගැටහවෙල මාර්ගයේ සුමිතිපාල මහතාගේ කඩේ අසල බෝක්කුව

යන බෝක්කු ප්‍රතිසංස්කරණය කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ් එම්.එම්. අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකගතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකගතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>05.03. ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා</u>**

**<u>05.03.01 බුළුපිටිය ග්‍රාම නිළධාරි වසමේ පේරන ගමෙහි දිළිදු පවුල් කිහිපයකට සනීපාරක්ෂක පහසුකම් (වැසිකිළි ආධාර) ලබා දීම.</u>**

බුළුපිටිය වසමෙහි පේරන ගමෙහි ජීවත්වන එස්.එම්.බන්දුල වීරසිංහ, එච්.එම්.ධම්මිකා මල්කාන්ති, ටී.එම්.අනුෂා ශ්‍යාමලී, ජේ.එම්.පුංචි බණ්ඩා යන අය සඳහා යන අය සඳහා වැසිකිළි පහසුකම් නොමැති හෙයින් ඒ අය සඳහා වැසිකිළි ඉදිකිරීම සඳහා ආධාර ලබා දීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ් එම්.එම්. අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට නැවතත් මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේ එම යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම නිල්ගල වැසිකිළි නොමැති පවුල් 04 සඳහා වැසිකිළි ඉදිකිරීම් කටයුතු බිබිල ප්‍රාදේශීය සභාවට සිදුකළ හැකි වුවත් ආධාර ලබා දීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට හා ආධාර ලබාදීම් සිදුකරනු ලබන විවිධ ව්‍යාපෘතීන් සඳහා මෙම වැසිකිළි ඉදි කිරීම සඳහා යොමු කිරීමට සුදුසු බව තීරණය කරන ලදී.

එම යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>05.04. ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්පකුමාර මැතිතුමා</u>**

**<u>05.04.01. අතුරු මාර්ගයක නම වෙනස් කිරීම සම්බන්ධවයි.</u>**

බිබිල , අඹගොල්ල හන්දිය, මඩකලපුව පාර පදිංචි සුමිත් අශෝක පුංචි හේවා යන අයගේ පියාණන් වන හිටපු ගම් සභාපති (1970 – 1977) අමරපාල පුංචි හේවා මහතාගේ ඉඩමෙන් අඩි 10ක අතුරු

මාර්ගයක් සඳහා ප්‍රදේශයේ ගම්වාසීන්ගේ ඉල්ලීම මත මීට වසර කිහිපයකට පෙර ලබා දී ඇත. මේ වන විට එම මාර්ගය **තරුමල්විල මාවත** ලෙස හඳුන්වන අතර මෙම මාර්ගය අමරපාල පුංචිහේවා හිටපු ගම් සභාපතිතුමාගේ පෞද්ගලික ඉඩමෙන් ලබාදී ඇති බැවිනුත් එතුමන් බිබිල ප්‍රදේශයට කළ සේවය වෙනුවෙන් කෘතවේදීත්වය පුද කිරීම සඳහාත් මතක සැමරුමක් ලෙසත් ඉහත මාර්ගය **අමරපාල පුංචිහේවා මාවත** ලෙස නම් කර නාම පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ් එම්.එම්. අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.එම්. රූපසේන මැතිතුමා විසින් මෙම තරුමල්විල මාර්ගය සම්බන්ධයෙන් අදහස් දක්වන ලදී. මෙම තරුමල්විල මාර්ගය අමරපාල පුංචිහේවා මැතිතුමාගේ මුණුබුරන් විසින් මීට පෙරද අත්පත්කර ගැනීම සිදු කර ඇති බැවින් එම මාර්ගයට අමරපාල පුංචිහේවා මාවත ලෙස නම් කළහොත් නැවතත් මෙම මාර්ගය අත්පත් කර ගැනීමට හැකියාව ඇති බැවින් එම මාර්ගය සඳහා මෙම නම යෙදීම සුදුසු නැති බවත් තරුමල්විල මාවත ලෙසම නම තිබීම සුදුසු බව පෙන්වා දුන් අතර එම අදහසට ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා ද එකඟ විය.

ගරු සභාපතිතුමා විසින් මෙම ශ්‍රේෂ්ඨ ගම් සභාපති අමරපාල පුංචිහේවා මැතිතුමාගේ නමින් මෙවැනි ආරවුල් නොමැති මාර්ගයකට අමරපාල පුංචිහේවා මාවත යන නම යෝජනා කරන ලෙස දන්වා සිටින ලදී.

ඒ අනුව මෙම අමරපාල පුංචිහේවා මාවත යන නම වෙනත් ආරවුල් නොමැති මාර්ගයකට යෙදීමට නම් කර නැවත යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස තීරණය කරන ලදී.

එම යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06. කාරක සභා වල වාර්තා ඉදිරිපත් කිරීම.**

## මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභා වාර්තාව 2025 ජූනි මාසය

- ✓ **දිනය:- 2025.06.27**
- ✓ **වේලාව:- පෙ.ව.10.00**

➢ **සාකච්ඡා කරන ලද කරුණු**

- **බිබිල ළමා උද්‍යානය අලංකරණය සඳහා ප්‍රදර්ශනාත්මක පුවරු සකස් කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම- උපාලි ඇඩ්වර්ටයිසින් ඇන්ඩ් අයන් වර්ක්ස් ආයතනය**

  බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බිබිල ළමා උද්‍යානය අලංකරණය සඳහා ප්‍රදර්ශනාත්මක පුවරු සකස් කිරීම වෙනුවෙන් රු.350,400.00 ක මුදලක් උපාලි ඇඩ්වර්ටයිසින් ඇන්ඩ් අයන් වර්ක්ස් ආයතනයට ගෙවීමට නිර්දේශ කරන ලදී.

- **වාහන සඳහා GPS උපකරණ සවිකිරීම**

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් වාහන සඳහා GPS උපකරණ සවිකිරීම වෙනුවෙන් රු.694,100.00 ක මුදලක් හා මාසිකව රු.12,100.00 ක මුදලක් ගෙවිය යුතු බැවින් ගෙවීම් අනුමැතිය සඳහා මාසික සභාව වෙත යොමු කිරීමට නිර්දේශ කරන ලදී.

- **කාර්යාල නිලධාරීන් සඳහා කාර්යාල පුටු මිලදී ගැනීම**

බිබිල ප්‍රාදේශීය සභාවේ කාර්යාල නිලධාරීන් සඳහා පුටු මිලදී ගැනීම නිර්දේශ කර ඒ වෙනුවෙන් 530,684.00 ක මුදලක් වැය වන බැවින් මාසික සභාව වෙත අනුමැතිය සඳහා යොමු කිරීමට නිර්දේශ කරන ලදී.

- **අත්‍යවශ්‍ය ලිපිද්‍රව්‍ය හා සෞඛ්‍ය උපකරණ පිළිබඳ දැනුම් දීම**

කාර්යාලයේ රාජකාරි කටයුතු සඳහා හා පවිත්‍රතා කටයුතු සඳහා අවශ්‍ය ලිපිද්‍රව්‍ය හා සෞඛ්‍ය උපකරණ ද්‍රව්‍ය තොග අවසන් වෙමින් පවතින බැවින් සෞඛ්‍ය අංශයේ සේවකයින් සඳහා අවශ්‍ය අත්වැසුම් හා සබන් සඳහා පසුගිය මාස 06 ඇතුළත ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇති බැවින් හා ඉල්ලා ඇති ප්‍රමාණය මුල් ඇණවුමෙන් 50% ක් බැවින් සබන් කෑට 100 ක් රු.13,756.00 කටද අත්වැසුම් ජෝඩු 50 ක් රු.14,750.00 කටද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 වගන්තිය අනුව මිලදී ගැනීමට නිර්දේශ කරන ලදී.

- **UP – LL – 6930 ටිපර් රථය අළුත්වැඩියාව සඳහා අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීම**

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් UP – LL – 6930 ටිපර් රථය අළුත්වැඩියාව සඳහා අවශ්‍ය අමතර කොටස් රු.49,276.14 ක මුදලකට INDRA MOTOR SPARES ආයතනයෙන් මිලදී ගැනීමට නිර්දේශ කරන ලදී.

- **PF – 7391 කැබ් රථයේ AC පද්ධතිය අළුත්වැඩියා කිරීම**

PF – 7391 කැබ් රථයේ AC පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා ලද රු.79,200.00 ක මිල කැඳවුම්පත මිල සාධාරණීකරනය සඳහා පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂක වෙත යොමු කරන ලදුව එහි අයිතමයන් 06 න් අයිතමයන් 04 ක් සඳහා පමණක් අනුමැතිය ලැබී ඇත. නැවත පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ විසින් ඉතිරි අයිතමයන් 02 සඳහාද මිල සාධාරණීකරන වාර්තාවක් ඉදිරිපත් කර ඇති බැවින් රු.79,200.00 ක මුදලකට PF – 7391 කැබ් රථයේ AC පද්ධතිය අළුත්වැඩියා කිරීම D.M.S.COOL TECH ආයතනයෙන් සිදුකරගැනීම නිර්දේශ කරන ලදී.

- **PF – 7391 කැබ් රථය සඳහා බැටරි මිලදී ගැනීම**

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් PF – 7391 කැබ් රථය සඳහා අවශ්‍ය බැටරිය විස්වම්ස් ආයතනයෙන් රු.39,500.00 කට මිලදී ගැනීම නිර්දේශ කරන ලදී.

- **ළමා උද්‍යානය සඳහා කොන්ක්‍රීට් මේස හා පුටු මිලදී ගැනීම.**

බිබිල ළමා උද්‍යානය සඳහා කොන්ක්‍රීට් මේස හා පුටු කට්ටලයක් රු.15,000.00 බැගින් පුටු කට්ටල 04 ක් රු.60,000.00 කට සංඛ හැන්ඩ් ක්‍රාෆ්ට් ආයතනයෙන් මිලදී ගැනීම නිර්දේශ කරන ලදී.

- **ගිනි නිවන උපකරණ යාවත්කාලීන කිරීම**

බිබිල ප්‍රාදේශීය සභාවේ සවිකර ඇති ගිනි නිවන උපකරණ යාවත්කාලීන කිරීම රු.43,145.00 කට ARC FIRE SOLUTIONS & SERVICES ආයතනයෙන් සිදු කර ගැනීම නිර්දේශ කරන ලදී.

- **ලිපිගොණු අල්මාරියක් මිලදී ගැනීම**

  බිබිල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු සංවර්ධන නිලධාරි එස්.එම්.කාංචනා මධුෂානි මහත්මියගේ රාජකාරි කටයුතු සඳහා අවශ්‍ය ලිපිගොණු අල්මාරියක් රු.37,034.30 කට ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මගින් මිලදී ගැනීම නිර්දේශ කරන ලදී.

- **නව පොදු වැසිකිළිය සඳහා නාම පුවරු සවිකිරීම**

  බිබිල ප්‍රාදේශීය සභාවට අයත් අලුතින් ඉදිකරන ලද සෞඛ්‍යාරක්ෂිත පොදු වැසිකිළිය සඳහා දැන්වීම් පුවරු සවිකිරීම අමතර වියදමක් බැවින් එම නාම පුවරු සවිකිරීම නිර්දේශ නොකරන ලදී.

- **බිබිල සතිපොළ අසල පළතුරු බීමහල සඳහා නව විදුලි සම්බන්ධතාවයක් ලබා ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම**

  මේ සඳහා මිල ගණන් ඉදිරිපත් කරන ලද ආයතන අතරින් අසිත හාඩ්වෙයාර් ආයතනය මිල ගණන් ඉදිරිපත් කර ඇති ද්‍රව්‍යන් සඳහා වර්ගයන් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම මිල කැඳවුම ප්‍රතික්ෂේප කරන ලද අතර බිබිල සතිපොළ අසල පළතුරු බීමහල සඳහා නව විදුලි සම්බන්ධතාවක් ලබා ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය ආසිරි ඉලෙක්ට්‍රොනික්ස් ආයතනයෙන් රු.63,115.00 කට මිලදී ගැනීමට නිර්දේශ කරන ලදී.

එම වාර්තාව ගරු මන්ත්‍රී ඒ.එම්. ජානක නාමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ වාර්තාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාවය විමසන ලදි.

ගරු සභාවේ මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාද ඊට එකඟතාවය පල කළෙන් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතුකල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරිම හා සලකා බැලිම.

2025 ජුනි මාසයට අදාල ලැබිම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ (ප්‍රා.ස. 16 හා ප්‍රා.ස. 14) සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර (ප්‍රා.ස. 07)සභාවේ දැනගැනීම හා අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි.

<u>ආදායම්</u>

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම් | - රු. 8,449,030.95 |
| මූලධන ලැබීම් | - රු. - |
| ප්‍රාග්ධන ලැබීම් | - රු. - |
| වෙනත් ලැබිම් | - රු. 870,979,96 |
| මුළු ලැබීම් | - රු 9,320,010.91 |

<u>වියදම්</u>

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | - රු. 8,685,519.73 |

| | |
|---|---|
| ප්‍රාග්ධන වියදම් | - රු. 14,970.00 |
| ණය ආපසු ගෙවීම් | - රු. - |
| වෙනත් වියදම් | - රු. 5,908,047.13 |
| ආයෝජන | _රු. - |
| මුළු වියදම් | - රු 14,608,536.86 |

**2025.06.31 දිනට තවදුරටත් හිග ආදායම් විස්තරය**

| | |
|---|---|
| වරිපනම් බදු | - රු. 18,941,024.12 |
| අක්කර බදු | - රු. 6,419.14 |
| ජල ගාස්තු නායකඳුර ජල යෝජනා ක්‍රමය | - රු. 1,717,582.06 |
| ජල රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය | - රු. 655,102.00 |
| කුලී මුදල් | - රු. 1,886,877.67 |
| ටෙන්ඩර් මඟින් කුලියට දීම් | - රු. 3,082,935.25 |
| එකතුව | - රු 26,289,940.24 |

ඉදිරිපත් කර ඇති ඉහත ආදායම් හා වියදම් වාර්තා ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අනතුරුව මෙම ආදායම් වියදම් හා හිඟ වාර්තා සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාවය විමසන ලදි.

ගරු සභාවේ මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාද ඊට එකඟතාවය පල කළෙන් ආදායම් වියදම් හා හිඟ ආදායම් වාර්තා ඒකමතිකව සභා සම්මත විය.

## 08.වෙනත් කරුණු

ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය හා ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා මෙදින මාසික සභා රැස්විම සඳහා නොපැමිණෙන බව ලිඛිතව දන්වා ඇති අතර නිවාඩු අනුමත කිරීම සුදුසු බව යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසී ය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය. 2025 ජූලි මස මහ සභාව සඳහා සහභාගි වූ සියළු දෙනා හට ස්තූතිය ප්‍රකාශ කර 2025 අගෝස්තු මස 19 දින පෙ.ව.9.30 ට සභා රැස්වීම් ශාලාවේදී රැස්වන බව දැනුම් දීමෙන් අනතුරුව ජූලි මස මාසික මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වී.සරත් විදානගම,
සභාපති ,
බිබිල ප්‍රාදේශීය සභාව

පිටපත් -

01. ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.

02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.

03.විගණන අධිකාරි, ජාතික විගණන උප කාර්යාලය, හුලංදාව,මොණරාගල- කා.දැ.ගැ.පි